# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත්
මව්බිමත්
ස්වර්ගයට
වඩා උතුම්ය!
Mother and
Motherland
are nobler
than Heaven



FOR FREE
CIRCULATION
නොමිලේ
බෙදාහැරීම
පිණිසයි
VOLUME 15
NUMBER 01

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MARCH & APRIL 2012 මාර්තු / අප්‍රියෙල් මාස (බුද්ධ වර්ෂ 2555 බක්)

http://www.lankaheritage.com/lankaviththi/





Photograph - Chathura S. Kodikara ඡායාරූපය - චතුර එස්. කොඩිකාර Rivira - Sri Lanka

එකලෙස් නිති සිතන රට ගැන නිදි නොලැබ
නෙකදෙස් මිතුරනට හෙළබස ලැදි දුලබ
පහලොස් තුරුණු විය අද සිටිනා එළඹ
හදතොස් මැදින් පුදනෙම් මෙම පත් කළඹ !

Aspiring restlessly every moment for our country's better
Friends, abiding in diverse lands awaiting a glimpse of a Sinhala letter
For you, we have worked out this Gift; our endeavours and tears
A newspaper - blossomed handsomely into youth, in fifteen years !

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*

# Illustrious 15 years of Lanka Viththi !

In the month of April 1997, on the Sinhala New Year Day, in London, a Sinhala language newspaper titled " Lanka Viththi" came out in print. It became the first Sinhala newspaper printed and published outside Sri Lanka. That was the beginning of a new era for our Sinhala expatriates in the UK.

Having established a good readership and their appreciation not only here, but in many distant countries such as Australia, New Zealand, Canada and also Sri Lanka, this small Sinhala tabloid became truly a success from the start to this day. So we have all the reason to be happy and content.

On this occasion of the 15th anniversary of the 'Lanka Viththi', we would like to thank all our readers, writers and advertisers - without their ongoing, invaluable support, this paper's success today, would never have been possible.

A Happy New Year to All !

# පහළොස් වසරක අභිමානය !

1997 වසරේ අප්‍රියෙල් මස සිංහල අවුරුදු දිනයේ ලංකාවිත්ති නමින් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක් ලන්ඩන් නගරයේ දී මුද්‍රණයෙන් බිහිවිය. එය ලංකාවෙන් බැහැර ලෝකයේ බිහිවූ ප්‍රථම සිංහල පුවත්පත ලෙස ඉතිහාසයට එක් විය. සැබැවින්ම එය එක්සත් රාජධානියේ වෙසෙන බොහෝ සිංහල ජනතාවට හිතට ඉමහත් සහනයක් වූ බව ඒ පත්‍රය දුටුමනතින් ඔවුන්ගේ මුහුණින් මතුවූ ප්‍රීතිදායක ඉරියව් තුළින් එදා අපි දුටුවෙමු. එය සැබැවින්ම විදේශයක වෙසෙන සිංහල ජන කොට්ඨාශයට අළුත් යුගයක් උදාවීමකි.

ක්‍රමයෙන් යහපත් සුවදායක පාඨක සමාජයක් අප පුවත්පත වෙනුවෙන් එක්සත් රාජධානියේ පමණක් නොව යුරෝපයේ, ඇමරිකාව, කැනඩාව ඕස්ටෙලියාව, නවසීලන්තය ආදී රටවල් වලද අප මව්බිම ශ්‍රීලංකාවේද ඇතිවිය. සංනිවේදනයේ මහිමය තුළින් ඇතිවූ ඒ බැඳීම හා විශ්වාසය තහවුරු වෙමින් පුවත්පතින් අප ඉදිරිපත් කළ කරුණු හා එම පාඨකයින් තුළ ඇති එකඟත්වය අපට පැහැදිලි විය. වෙනත් පුවත් පත් හා සසඳන කල කුඩා ටැබ්ලොයිඩ් පත්‍රයක් වූ **ලංකාවිත්ති** හි සාර්ථකත්වය නම් ඒ මුල් පත්‍රයේ සිට මේ දක්වාම ඒ කෙරෙහි සිංහල කියවන ජනතාව තුළ පවතින ඇල්මයි. එය අපේ සෑහීමට ප්‍රමාණවත්ය.

**ලංකාවිත්තියට** 15 වසරක් සම්පූර්ණ වන මේ අවස්ථාවේ අපේ පාඨක පිරිසට, අපට දැන්වීම් දීමෙන් අනුග්‍රහය දක්වන ව්‍යාපාරික මහත්ම මහත්මීන්ට සහ නන් අයුරින් සහාය දක්වන සියළු දෙනට අපේ අවංක ස්තුතිය පුදකරනු කැමැත්තෙමු. ඔවුන් නොවන්නට සාර්ථකත්වයක් ගැන අපට කතාකළ නොහැකි ය.

**ඔබ සැමට ප්‍රීතිමත් අළුත් අවුරුද්දක් වේවා !**







විස්තර
පිටු අංක
3